සැ. යු. -2018.07.26 දින පළවූ අංක 2082 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,083 - 2018 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2018.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1660 |

*සැ. යු.*-(i) ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධනය) පනත් කෙටුම්පත 2018 ජූලි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අගෝස්තු මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 නොවැම්බර් මාසයේ දී දිවයින පුරා පිහිටි පහත දැක්වෙන ප්‍රධාන නගර වලදී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය ඉදිරි කාලයේ දී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක

| *පළාත* | *නගරය* | *නගර අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරුමැද | අනුරාධපුරය | 20 |
| | පොළොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොණරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් අයදුම්කරුගේ දෙවන තේරීම අනුව සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත එම අයදුම්කරුවන් යොමු කරනු ලැබේ. යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත. විභාගය ඉල්ලුම් කරනු ලබන නගර අයදුම්කරුවන්ගේ අවශ්‍යතාවයට පසුව වෙනස් කරනු නොලැබේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාවය* :-

(i) සෑම අයදුම්කරුවකුට ඔහු / ඇය :-

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු බවත්,

(ආ) විශිෂ්ට චරිතයකින් යුතු අයකු බවත්,

(ඇ) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 24 ට නොවැඩි බවත්, පිළිගත හැකි සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2000.08.31 වැනි දින හෝ ඊට පෙර හා 1994.08.31 වැනි දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

***සටහන*** .- යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) *ශාරීරික යෝග්‍යතාවය*.-පිරිමි අයදුම්කරුවකුගේ උස අඩි 5 අඟල් 5 ට අඩු නොවිය යුතු අතර, පපුව ප්‍රසාරණය කළ විට අඟල් 33 ට නොඅඩු විය යුතුය. (අයදුම්කාරියන් සඳහා මෙය අදාළ නොවේ)

ගැහැණු අයදුම්කාරියන්ගේ උස අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුය.

(iii) *අධ්‍යාපන සුදුසුකම්*.- සෑම අයදුම්කරුවකුට / අයදුම්කාරියකට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් තුනකින් එකවර සමත්වීම;

*සහ*

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් වශයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව සම්මාන සාමර්ථ්‍යයන් පහක් ද, ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථයක් සහිතව

දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් විය යුතුය.

03. *සේවා කොන්දේසි* :

(i) මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.:-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 3/2016 හි අනුව වැටුප් ක්‍රමය - RS - 1 දරන වැටුප් කාණ්ඩයේ, රු. 29,540 - 300 x 7 - 370 x 27 = රු. 41,630 වන අතර, (2016.01.01 දින සිට 2020.01.01 දින දක්වා වැටුප් ගෙවීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 සඳහන් විධිවිධාන අදාළවේ.)

(ii) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය.

(iii) තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන් විසින් තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳීසිටිය යුතුය.

(vi) මෙම *ගැසට් පත්‍රයේ* 1 වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය*.-බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (01) | අභියෝග්‍යතාව (පැය 01 යි) | ලකුණු 100 යි |
| (02) | ගණිතය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (03) | ඉංග්‍රීසි භාෂාව (පැය 01 1/2 යි ) | ලකුණු 100 යි |
| | එකතුව | ලකුණු 300 යි |

*අභියෝග්‍යතාව ප්‍රශ්න පත්‍රය*.-මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහාවන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*ගණිතය*.-ගණිත හැකියාව මැනීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය*.-අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ, ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

*සටහන*.-මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02 (III) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම (එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පෙනී සිටිය යුතුය. කෙසේ වුව ද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිට සමත් වූ අයදුම්කරුවකුට/අයදුම්කාරියකුට නැතහොත් දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලද අයදුම්කරුවකුට/අයදුම්කාරියකට තමා කැමතිනම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයීමට හැකිවේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ට /අයදුම්කාරියන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතුය.විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) *ඇගයීමේ ක්‍රමය*.-තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව ලකුණු ලබා ගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් පවත්නා පුරප්පාඩු අනුව අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10 ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහි දී අයදුම්කරුවන්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර,විභාගයේ දී ලබාගත් ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල.-

කලාප මට්ටම් කේවල ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවන ස්ථානයට ලකුණු 2 යි. තුන්වන ස්ථානයට ලකුණු 1යි.

දිස්ත්‍රික් මට්ටමේදී කේවල ප්‍රථම ස්ථානයට ලකුණු 4යි. දෙවන ස්ථානයට ලකුණු 3 යි. තුන්වන ස්ථානයට ලකුණු 2යි.

ජාතික මට්ටමේදී කේවල ප්‍රථම ස්ථානයට ලකුණු 5යි. දෙවන ස්ථානයට ලකුණු 4 යි. තුන්වන ස්ථානයට ලකුණු 3යි.

05. තෝරා ගැනීමේ පදනම - ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අදාළ බඳවාගැනීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10%කට නොවැඩි ප්‍රමාණයක් අයදුම්කාරියන් සඳහා වෙන් කෙරේ.

(i) ප්‍රතිඵල නිකුත් කිරීම - ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ලිඛිත විභාග ලකුණු හා සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

**සටහන :** රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරී ස්වභාවය අනුව කාන්තා නිලධාරිනියන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හී සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(i) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

07. ඉල්ලුම් කිරීමේ පිළිවෙල :

(i) *ආදර්ශ අයදුම්පත* - මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන්ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතුය. (ආදර්ශ අයදුම් පත්‍රයේ 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ද, 06 සිට 11 තෙක් දෙවන පිටුවේ ද ඉතිරිය තුන්වන පිටුවට ද වනසේ ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න) ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කොට තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත්, නැවත විමසිලිවත් වන්න.

(ii) අයදුම්පත් 2018.08.31වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රය බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.(සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක:2003-02-13 යටතේ ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 600/- ක මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකරනු ඇත. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. 2018.08.31 දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්

වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුවද නියමිත දිනට පසුව ලැබුනහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(v) *සහතික කිරීම* - දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, නොතාරිස් කෙනකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියකු, වාර්ෂිකව රුපියල් 240,360/- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකියයුතු තත්ත්වයක් දරන කෙනකු විය යුතුය.

08. *විභාග ප්‍රවේශ පත්‍ර* - ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාග යට පෙනී සිටින භාෂා මාධ්‍ය, නගරය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අයදුම්කරුවෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය.

කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක්ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම* - විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර , නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අයදුම්කරුවකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම ගැසට්පත්‍රයේ පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අයදුම්කරුවන් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අයදුම්කරුවන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

(iii) අයදුම්පත්‍ර ලැබුන බව අයදුම්කරුට දන්වනු නොලැබේ.

සටහන : විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරුවකු විභාග යට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. *අනන්‍යතාව*: අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි*:

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හැර වෙනත් කිසිදු ලිපිලේඛනයක් නො එවිය යුතුය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වේතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්

*සටහන* : එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රුපියල් 240,360 /- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තකු යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබාගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අයදුම්කරුවන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අයදුම්කරුගේ / අයදුම්කාරියගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අයදුම්කරුවන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

සටහන් :

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උද්ධෘත භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අයදුම්කරු/ අයදුම්කාරිය සාමාන්‍යයෙන් භාවිත කරන එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේනම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමිවූ පුරවැසිබවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි)

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරී ලියවිලි,

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක්වූ කුසලතා සම්බන්ධ ලේඛන,

(vi) අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරිමට ප්‍රමාද කරන අයදුම්කරුවකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* .- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරුවකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත් , හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල , දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව.

රේගු මන්දිරය,
අංක 40, කෙළින් වීදිය,
කොළඹ 11.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*ආදර්ශ අයදුම් පත්‍රය*

*ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018*

OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO POSTS OF INSPECTOR OF CUSTOMS, GRADE II OF SRI LANKA CUSTOMS DEPARTMENT - 2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

| නගර තේරීම | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
:————————.
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————————.

02. ස්ථිර පදිංචි ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය :

3.2 නිකුත් කළ දිනය : අවුරුද්ද මාසය දිනය

04. ස්ත්‍රී පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. උපන් දිනය :

(අ) අවුරුද්ද මාසය දිනය

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු මාස දින

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ :

පරම්පරාවෙන් - 1
ලියාපදිංචියෙන් - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. ජනවර්ගය :
සිංහල - 1
ලංකා දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
බර්ගර් - 5
වෙනත් - 6

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. ජංගම දුරකථන අංකය :

09. ශාරීරික යෝග්‍යතාව :
(i) උස : අඩි :————. අඟල් :————.
(ii) පපුව (ප්‍රසාරණය කළ විට) : අඟල් :————.
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි)

10. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවකු වී තිබේ ද? ඔව්/නැත
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ වර්ෂය

විභාග අංකය

| විෂයයන් | සාමාර්ථ්‍යය | විෂයයන් | සාමාර්ථ්‍යය |
|---|---|---|---|
| | | | |
| | | | |

(ii) අ.පො.ස. (සා.පෙළ)

| විෂයයන් | සාමාර්ථ්‍යය | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සාමාර්ථ්‍යය | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

(iii) අ.පො.ස. (සා.පෙ.) ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා ඇත් ද? ඔව්/නැත

12. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතුය)

(i) ගෙවන ලද තැපැල්/ උප තැපැල් කාර්යාලය :————.

(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.

(iv) ලදුපතේ අංකය :————.

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.) |

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු ය)

13. අයදුම්කරුගේ ප්‍රකාශය / සහතිකය ඃ

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න) ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... නමැති මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු /ඇය ......... මස ......... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව)
දිනය :————.

*සටහන ඃ* අයදුම්පත සහතික කළ යුත්තේ *ගැසට් නිවේදනයේ* 7(v) ඡේදයේ සඳහන් පරිදි ය.

15. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව)

දිනය :————.
ආයතන ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
සේවා ස්ථානයේ ලිපිනය :————.

08-133

ප්‍රධාන රේගු පරීක්ෂකවරුන් සහ I වන ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරුන් වෙත,

## II වන පන්තියේ සහකාර රේගු අධිකාරී තනතුරට උසස් කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරග විභාගය - 2018

II වන පන්තියේ සහකාර රේගු අධිකාරී තනතුරු පුරප්පාඩුවලින් 15% ක් පිරවීම සඳහා, පහත සඳහන් සුදුසුකම් ඇති :

(අ) ප්‍රධාන රේගු පරීක්ෂකවරුන්ගෙන්; හෝ

(ආ) I වන ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරයකු වශයෙන් වසර 02ක සේවා කාලයක් හා තනතුරේ ස්ථිර කර ඇති රේගු පරීක්ෂකවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. වෘත්තීය සුදුසුකම් :

(i) අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම සහ එම කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව, පූර්වාසන්න වසර 05 ක් තුළ කාර්ය සාධන ඇගයීම් සාමාන්‍ය මට්ටමේ හෝ ඉන් ඉහළ අගයක් පෙන්නුම් කර තිබීම.

(iii) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත්වී තිබීම.

02. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 09 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය.සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් සිය අංශ ප්‍රධානියා මගින් 2018.08.31 වැනි දින හෝ ඊට පෙර අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්) වෙත ලැබෙන සේ එවිය යුතුය. විභාග ගාස්තුව රු. 500.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුය. මුදල් ගෙවූ රිසිට්පතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතා යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නො ලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇනවුම් භාරගනු නො ලැබේ.

03. මෙම විභාගය "ලිඛිත පරීක්ෂණය" හා "සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය" වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයයට පිරිනමනු ලබන ලකුණු ප්‍රමාණය හා ලැබෙන කාලය පහත දැක්වේ. :

1 වැනි කොටස

| *ලිඛිත පරීක්ෂණය* | *ලකුණු* |
|---|---|
| 01. රේගු පරිපාටිය (පැය 02යි) | 100 |
| 02. සරල ගණිතය (පැය 01යි) | 100 |

2 වැනි කොටස - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)

තනතුරට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා-

විභාගය සිංහල,දෙමළ,ඉංග්‍රීසි යන මාධ්‍යය තුනෙන්ම පවත්වනු ලැබේ. අයදුම්කරුවකු විසින් මුළු විභාගයටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යයේ වෙනසක් සිදු කිරීමට ඉඩ දෙනු නො ලැබේ. අයදුම්කරුවන් තමන් එම සේවයට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැක. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

04. මෙම විභාගයේ විෂයයන්ට අදාළ විෂයය නිර්දේශ පත්‍රය පහත දැක්වේ. :

රේගු පරිපාටිය ප්‍රශ්න පත්‍රයට අයත් විෂයය නිර්දේශය.

i. (අ) නැව් බඩු/ ගුවන් බඩු ගොඩබෑම, ගබඩා කිරීම හා නිෂ්කාශනය කිරීම
(ආ) ආනයන ගුදමක් භාරව කටයුතු කරන සහකාර රේගු අධිකාරී II වන ශ්‍රේණියේ නිලධාරියකුගේ රාජකාරී කටයුතු
(ඇ) නිල්පොත අවසන් කිරීම
(ඈ) මත්පැන් ගුදම භාරව කටයුතු කරන සහකාර රේගු අධිකාරී II වන ශ්‍රේණියේ නිලධාරියාගේ රාජකාරී කටයුතු හා වගකීම්

ii. අපනයන - (අ) නෞකාගත කිරීම සඳහා ලැබෙන නැව් බඩු පිළිබඳ අනුගමනය කරන ක්‍රියා පරිපාටිය
(ආ) අපනයන විස්තර පරීක්ෂා කිරීම
(ඇ) තොග පොත සකස් කිරීම

iii. සංක්‍රමණික බඩු - (අ)නැව් බඩු තැන්පත් කිරීම හා නෞකාගත කිරීම
(ආ)සංක්‍රමණික නැව්බඩු ලේඛනය සකස් කිරීම
(ඇ)වෙරළබඩ නෞකාගත කිරීම

iv. බැඳි ගුදම්වලට අදාළ භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලිය

v. *සාමාන්‍ය.*-ආපසු ගෙවීම සහ එම ආපසු ගෙවීම් අනුමත කිරීම සඳහා වූ කොන්දේසි

තීරු ගාස්තු ආපසු ලබා ගැනීම සඳහා බලපාන රෙගුලාසි, තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ වගුව - දිවයින තුළට හා දිවයිනෙන් පිටතට

රේගු ආඥාපනත යටතේ භාණ්ඩ පිළිබඳ ප්‍රකාශයක් නොකිරීම, වැරදි ප්‍රකාශයක් කිරීම හෝ අඩුවෙන් මිල ගණන් දැන්වීම පිළිබඳ කටයුතු කිරීම සඳහා දී ඇති බලතල

සෝදිසි කිරීම හා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් රේගු ආඥා පනතේ නියම කොට ඇති ක්‍රියා මාර්ග

හොරෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට එරෙහිව කටයුතු කිරීම ගැන රේගු ආඥා පනතේ නියම කොට ඇති විධිවිධාන, නිලධාරීන්ගේ රාජකාරී කටයුතුවලට බලපාන සියලුම දෙපාර්තමේන්තු නියෝග

05. "සරල ගණිතය" ප්‍රශ්න පත්‍රයට අයත් විෂය නිර්දේශය පහත දැක්වේ. :

අයදුම්කරුගේ එකතු කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හා බෙදීම ආදී ගණිතමය හැකියාව මැනීම, සාමාන්‍ය ගණිතමය ගැටලු නිරාකරණයේ වේගය මැනීම, ගණිතමය ගැටලු විසඳීමේ බුද්ධිමය හැකියාව හා තර්කනය පිළිබඳ හැකියාව මැනීම සඳහා සරල අංක ගණිතමය ප්‍රශ්න පත්‍රයකි.

06. 6.1 රේගු පරිපාටිය සහ සරල ගණිතය යන විෂයයන් දෙකෙන් එක් එක් විෂයය සඳහා වූ ලකුණු වලින් එක් විෂයකට අවම වශයෙන් 40% ක් හා විෂයයන් දෙකටම ලකුණු 100 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන්නේය.

6.2 ප්‍රතිඵල නිකුත් කිරීම :

ඉහත 6.1 ඡේදයට අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් කටයුතු යොදනු ඇත.

07. 7. I *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත්‍ර ඉදිරිපත් කොට ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නො ලද අයදුම්කරුවෙක් වේනම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් **ෆැක්ස් අංකය වෙත** යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

7. II අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නො ලැබේ.

7. III අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. 8.I අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුර

සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

08\. II මෙම විභාගය පවත්වනුයේ කොළඹදී පමණි. විභාගය පවත්වනු ලබන දිනය හා ස්ථානය පසුව දන්වනු ලැබේ.

09\. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10\. සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇතිබව පෙනී යන්නේනම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය *ගැසට් නිවේදනය* බලපැවැත්වේ. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

රේගු අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව.

රේගු මන්දිරය,
නො. 40 ,
කෙළින් වීදිය,
කොළඹ 11.

ආදර්ශ අයදුම්පත්‍රය

**II වැනි පන්තියේ සහකාර රේගු අධිකාරී තනතුරට උසස් කිරීම සඳහා**
**පැවැත්වෙන සීමිත තරග විභාගය - 2018**

LIMITED COMPETITIVE EXAMINATION FOR PROMOTION TO THE POST OF ASSISTANT SUPERINTENDENT OF CUSTOMS, CLASS II - 2018

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය ඃ
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1\. නම ඃ
 1.1 සම්පූර්ණ නම ; (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
 (උදා ඃ HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
 1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම ඃ
 (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————. (උදා :GUNAWARDHANA H.M.S.K.)
 1.3 සම්පූර්ණ නම ඃ (සිංහලෙන්/ දෙමළෙන්) :————.

2\. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
 (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3\. 3.1 ජාතික හැඳුනුම්පත් අංකය ඃ

 3.2 දෙපාර්තමේන්තු හැඳුනුම්පත් අංකය :————.

4\. ස්ත්‍රී පුරුෂ භාවය ඃ
 පුරුෂ - 0
 ස්ත්‍රී - 1
 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5\. දැනට දරන තනතුර සහ ඊට පත්වූ දිනය :————.

6. ඉහත තනතුරේ ස්ථිර කළ දිනය :————.
7. සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය :————.
8. දැනට සේවය කරන ස්ථානය :————.
9. පසුගිය අවුරුදු 05 තුළ ඔබට විරුද්ධව විනය :————.
   පරීක්ෂණයක් පවත්වා තිබේද ?
10. අධ්‍යාපන සුදුසුකම් :————.
11. වෙනත් විශේෂ සුදුසුකම් :————.
13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :
    (i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
    (ii) ලදුපත් අංකය :————.
    (iii) ගෙවන ලද මුදල :————.
    (iv) ගෙවූ දිනය :————.

| ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න. |
|---|

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, නිවේදනයේ 03 වන ඡේදයට අනුව දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

*අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................ මහතා/ මහත්මිය/ මෙනවිය මාගේ කාර්යාලයේ නිලධාරියෙකු /නිලධාරිනියක බවත් මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් සහතික කරමි.

අත්සන :————. දිනය :————.
නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

ඉහත අයදුම්කරු වන ................................................ මහතා / මහත්මිය / මෙනවිය මාගේ කාර්යාලයේ සේවයේ නියුතු ප්‍රධාන රේගු පරීක්ෂක / 1 වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරයකු/ වරියක බවත්, අයදුම්පතෙහි අංක 01 සිට 11 දක්වා ඡේදයන්හි සඳහන් තොරතුරු නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා අංක ............ හා ............ දිනැති ලදුපත අලවා ඇති බවත්, මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෙක් බවත් සහතික කරමි.

අත්සන :————. දිනය :————.
නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08-134

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - කාර්යක්ෂතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ.

(i) විෂය අංක **01** - පාසල් පරිපාලනය හා අධීක්ෂණය, ලකුණු 100 - කාලය පැය 03

(ii) විෂය අංක **02** - පාසල් සැලසුම්කරණය, ලකුණු 100 - කාලය පැය 03

(iii) විෂය අංක **03** - අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර ; ලකුණු 100 - කාලය පැය 03

*විෂය නිර්දේශය* :

(i) *පාසල් පරිපාලනය හා අධීක්ෂණය* :
පාසලක යහපාලනය සඳහා විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කෙරේ. පාසල් කළමනාකරණ ක්‍රමවේද, කාලසටහන් සැකසීම, වගකීම් බෙදා දීම, පාසල් සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය, පාසල් පාදක කළමනාකරණය, පාසල් පාදක ගුරු සංවර්ධනය, ගුරු සුභසාධනය, ශිෂ්‍ය හිතකාමී පාසල් සංකල්පය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(ii) *පාසල් සැලසුම්කරණය* :
සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ. පාසල් කළමනාකරණ මණ්ඩල, පාසලක දැක්ම හා මෙහෙවර, පාසල් තොරතුරු පාදක සැකසීම, සංයුක්ත සැලසුම්, දීර්ඝ කාලීන හා කෙටි කාලීන සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්, පාසල් ජාල හා සම්පත් සැලසුම් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට පාසලේ දායකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(iii) *අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර* :
ඉගෙනීම හා ඉගැන්වීම් පිළිබඳ නව සංකල්පය, අත්දැකීමෙන් ඉගෙනීම, තර්කානුකූල චින්තනය, අධ්‍යාපනයේ සමතාව, විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නිපුණතා පාදක අධ්‍යාපනය, ජීවත්වීම සඳහා අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන හා වෘත්තීයමය මාර්ගෝපදේශනය යන විෂය කරුණු පිළිබඳ දැනුම මැන බැලේ.

03. සාමාර්ථය ලැබීම සඳහා අපේක්ෂකයෙකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

04. *විභාගයේ භාෂා මාධ්‍යය* :- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

05. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06. මෙම නිවේදනය අවසානයේ දක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන බව වැඩිදුරටත් සඳහන් කරමි. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

07.විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීතිරීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

08. ඉල්ලුම්පත්‍ර 2018 සැප්තැම්බර් මස 03 වැනි දින හෝ ඊට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ'' ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. (i) ඉල්ලුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු ම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ
(iii) වලංගු රියැදුරු බලපත්‍රය හෝ
පමණක් පිළිගනු ලැබේ.

12. *විභාග ගාස්තු* :

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

(*ආ*) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ. :-

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 500/- |
| එක් විෂයයක් සඳහා | : | රු. 250/- |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

13. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

14. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතීනම් එහි දී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

15. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 ජූලි මස 19 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

Efficiency Bar Examination for Officers in Class 2 of Sri Lanka Principals' Service -2018

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ - 3 ☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.) :——.

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා:- GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය :
(i) පෞද්ගලික :————————————.
(ii) රාජකාරි :————————————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) දුරකථන අංකය : (රාජකාරි) :——————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය :——————.
(ii) පාසල / කාර්යාලය :————————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය :————————.

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය :
☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ii) උපන් දිනය :
වර්ෂය :☐☐☐☐ මාසය :☐☐ දිනය :☐☐

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

6. ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. *ගැසට් නිවේදනයෙහි* 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂයය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :

විෂයය අංක 01- පාසල් පරිපාලනය හා අධීක්ෂණය ☐
විෂයය අංක 02- පාසල් සැලසුම්කරණය ☐
විෂයය අංක 03-අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර ☐

අදාළ විෂයය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.

8. මීට ප්‍රථම අංක 1086/26 හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව පැවති කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත් නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 33/2014 පරිදි මෙම 2 වන කාර්යක්ෂමතා කඩඉමෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එම විෂයය සමත් නම් වසර, සාමර්ථ්‍යය හා මාධ්‍යය ද සඳහන් කරන්න.

| *විෂයය* | *වසර* | *සාමර්ථ්‍ය* | *මාධ්‍යය* |
|---|---|---|---|
| අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය | | | |

9. *විභාග ගාස්තු* :
(i) ගෙවන ලද තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
(ii) ගෙවූ මුදල :————.
(iii) ගෙවූ දිනය :————.
(iv) ලදුපත් අංකය :————.

*ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)*

10. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/ පළාතේ නිලධාරියකු බව සහතික කරමි. තවද

අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බවද සහතික කරමි.

————,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පළාත්
අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අදාළ නොවන වචන කපා හරින්න)

08 - 204/1

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළ කර ඇත.අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂයය ඉල්ලූ නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(*අ*) *විභාග පටිපාටිය* - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ. :-

(i) විෂය අංකය 01- ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති.

ලකුණු 100 - කාලය පැය 02

(ii) විෂයය අංකය 02 - පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි.
ලකුණු 100 - කාලය පැය 02

*විෂයය නිර්දේශය* :

(i) ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති -ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, VIII, IX, X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

(ii) පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි -

අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්,රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ වේතන, රාජකාරි දූරකථන පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

03. සාමාර්ථය ලැබීම සඳහා අපේක්ෂකයකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

04. *විභාගයේ භාෂා මාධ්‍යය* :- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

05. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු වලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

(*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්*.- ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.)

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

08. ඉල්ලුම්පත්‍ර 2018 සැප්තැම්බර් මස 03 වැනි දින හෝ ඊට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503,කොළඹ'' ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. (i) ඉල්ලුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුයි. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ
(iii) වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ.

12. *විභාග ගාස්තු* :

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ.
(*ආ*) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.
(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 500/- |
| එක් විෂයයක් සඳහා | : | රු. 250/- |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

13. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්‍ෂයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

14. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එහිදී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

15. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 ජූලි මස 19 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

Efficiency Bar Examination for Officers in Class, 3 of Sri Lanka Principals Service - 2018

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව,ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ. වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල -2
දෙමළ - 3 ☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා* :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.) :——.

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා*:- GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරී :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) දුරකථන අංකය : (රාජකාරී)————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය :————.
(ii) පාසල / කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය :————.

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය :
☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ii) උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය:
පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6. ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. *ගැසට් නිවේදනයෙහි* 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :-

විෂයය අංකය 01- ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - ☐
විෂයය අංකය 02 - පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි ☐

අදාළ විෂයය අංකය/අංක කොටුව/ කොටු තුළ ලියන්න.

8. විභාග ගාස්තු :-

(i) ගෙවන ලද තැපැල්/උපතැපල් කාර්යාලය :- ...........
(ii) ගෙවූ මුදල :- .................. (iii) ගෙවූ දිනය :-........
(iv) ලදුපත් අංකය:- ................................

| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |
|---|

9. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10. විභාග කොමසාරිස් ජනරාල් :

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/පළාතේ නිලධාරියෙකු බව සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

————,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අදාළ නොවන වචන කපා හරින්න).

07-204/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **අගෝස්තු** | 2018.08.03 | සිකුරාදා | 2018.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.10 | සිකුරාදා | 2018.07.26 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.08.17 | සිකුරාදා | 2018.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.24 | සිකුරාදා | 2018.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.31 | සිකුරාදා | 2018.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2018.09.07 | සිකුරාදා | 2018.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.14 | සිකුරාදා | 2018.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.21 | සිකුරාදා | 2018.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.28 | සිකුරාදා | 2018.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2018.10.05 | සිකුරාදා | 2018.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.12 | සිකුරාදා | 2018.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.19 | සිකුරාදා | 2018.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.26 | සිකුරාදා | 2018.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.